## කෑගල්ල නගර සභාව
## කෑගල්ල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජූනි 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 26 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 03 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයේදී පොත් අගය වැඩිවීම රු. 3,056,651,842 ක් සහ අලුතෙන් හඳුනාගත් අගය රු.604,641,000 ක් වූයෙන් වැඩි වූ මුළු ප්‍රත්‍යාගණන අගය රු. 3,661,292,842 ක් වුවද, එය රු. 3,595,439,830 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉඩම් හා ගොඩනැගිලි රු.65,853,012 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රත්‍යාගණන වටිනාකම හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | සියලු ස්ථාවර වත්කම්වල තොරතුරු නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභාව සතු බදු දේපල 44 කට අදාළ ඉඩම් අක්කර 2.76 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සියලු ජංගම නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | සභාව සතු බදු දේපල තක්සේරුකර ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මෝටර් රථ හා කරත්ත ශේෂය රු.978,803 ක් අඩුවෙන් දක්වා තිබුණි. | භාවිතයෙන් ඉවත් කලද, අපහරණය කරන තුරු වටිනාකම ඉවත් නොකල යුතුය. | 2020 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දී වරිපනම් බදු සඳහා ලබා දුන් වට්ටම් රු.374,014 ක් ගිණුම්ගත කර නොතිබුණි. | දුන් වට්ටම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | 2020 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු උසාවි දඩ ආදායම් රු.93,904 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ඊ) | ණයහිමි අයි වෙන්කිරීම් රු.2,455,772 ක් සඳහා අදාළ ගැලපීම් සිදුකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණයහිමියෝ එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ණයහිමි අයි වෙන්කිරීම් සඳහා අදාල ගැලපීම් නිවැරදිව සිදුකල යුතුය. | 2020 වර්ෂයේදී ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 6කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර එකතුව රු. 34,931,358 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය. | සභාව සතු වාහන 16 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ සේවා නියුක්ති ආදායම යටතේ උපයන විට බදු ගෙවීම් වගු අංක 07 ප්‍රකාරව නාගරික මන්ත්‍රීන් වශයෙන් කටයුතු කළ නිලධාරීන් 03 දෙනෙකුට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ ගෙවා තිබූ මන්ත්‍රී දීමනා රු.1,266,746 කට අදාලව උපයන විට බදු රු.126,675 ක් අයකර ගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී බදු පනතට අනුව කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 81,870,582 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 38,369,260 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,100,000 | 12,033,434 | 13,069,077 | 2,062,606 | 11,650,000 | 11,929,495 | 12,351,605 | 2,733,928 |
| කුලී | 46,453,180 | 49,770,578 | 49,647,942 | 3,991,322 | 42,686,600 | 42,816,095 | 42,801,902 | 3,853,232 |
| බලපත්‍ර ගාස්තු | 3,095,500 | 3,307,174 | 3,343,515 | 373,700 | 2,695,500 | 3,614,568 | 3,675,648 | 412,040 |
| වෙනත් ආදායම් | 41,729,000 | 55,002,030 | 61,661,097 | 24,200,234 | 116,737,953 | 116,273,133 | 123,618,300 | 27,583,559 |

#### 2.2.2 වරිපනම් හා බදු

------------------

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,997,165 ක් වූ අතර ඉන් රු.1,066,108 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් හිඟහිට තිබූ ශේෂ විය. එම හිඟ ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් තවදුරටත් අවම කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 2.2.3 කුලී

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟ හිට ඇති රු1,299,063 ක් වූ කුලී හා ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී හා ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වෙළඳපල කුලී , සතිපොල කුලී තානායම් කුලී සහ වැසිකිළි ගාස්තු කපාහැරීමේ නියෝග ලබාගැනීම සඳහා සභා අනුමැතියට ඉදිරිපත් කර ඇති බව දන්වමි. |

## 2.2.4 වෙනත් ආදායම්

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟහිට ඇති පදික කඩ දඩ රු. 2,055,639 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි දඩ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නොපමාව කටයුතු කල යුතුය. | හිඟ කඩකුලී අයකරීමේදී ඉතිරි දඩ මුදල්ද සමඟ අයකිරිමට කටයුතු කරන බව දන්වමි. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) අතුරු ව්‍යවස්ථා

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය ප්‍රකාරව සබරගමුව ප්‍රධාන අමාත්‍යාංශය මඟින් මහජන සෞඛ්‍ය පිළිබඳව සම්පාදනය කර එවා ඇති අතුරු ව්‍යවස්ථා 16 න් නගර සභාවට අයත් අතුරු ව්‍යවස්ථා 12 ක් සම්මත කර ගැසට් කර ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්මත කර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී එම අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| | නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරී / ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ වර්ෂය තුළ දී ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන සංවර්ධන කටයුතු, සැපයීම් හා සේවා සහ වෙනත් කාර්යයන් කිසිවක් ඇතුලත් කර නොතිබුණි. | සියලුම සංවර්ධන කටයුතු, සැපයීම් හා සේවා සහ වෙනත් කාර්යයන් ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |
| (ii) | කාර්යසාධන වාර්තාවේ අනුකූලතා වාර්තාව අනුව දේපළ තක්සේරු කිරීම, වාහන අපහරණය, අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ බඳවාගෙන ගෙවීම් කිරීම, ආයතනික තොරතුරු වෙබ් අඩවිය හරහා ලබාදීම, පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම හා මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම යන කරුණු සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | වාර්ෂිකව ඉටු කල යුතු කාර්යයන් ඉටු කිරීමට වග බලා ගත යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |
| iii | කාර්යසාධන වාර්තාවේ ක්‍රියාකාරී සැළැස්ම මත පදනම්ව ආයතනයේ කාර්යසාධන දර්ශක පිළියෙළ නොකිරීමෙන් අපේක්ෂිත නිමවුම් මට්ටම් වල කාර්යසාධනය ඇගයීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව කාර්යයසාධනය ඉදිරිපත් කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් නිකුත් කර තිබූ බලපත්‍රය 2019 ඔක්තෝබර් 18 දිනෙන් අවසන් වී තිබුණද, අවලංගුවීමට මාස 03 කට පෙර අළුත්කිරීමේ අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමට සහාව කටයුතු කර නොතිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් පමණක් අදාල බලපත්‍රය නිකුත් කර තිබුණද, එම ප්‍රදේශයටම මල අපද්‍රව්‍ය බැහැර කිරීමද සිදුකරමින් තිබුණි. | බලපත්‍රය අවලංගුවීමට මාස 03 කට පෙර අළුත්කිරීමේ අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුවේ. | ගොඩ ක්‍රමය මගින් කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ලබාගෙන තිබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රය කල් ඉකුත් වුවද, කවෂිමා කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලියට අනුගත වීමට ඇති හෙයින් නව බලපත්‍රයක් ලබාගත යුතු බව දන්වමි. |

**3.2** **කළමනාකරණ දූර්වලතා**

| | නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 අගෝස්තු 16 දිනැති හා අංක 04/2017 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3.1(i)ඇ ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට කමිටු 02 ක් 2019 නොවැම්බර් 26 දින පත්කර තිබූ නමුත් තක්සේරු වාර්තා සම්පූර්ණ කර ඉදිරිපත් කර නොතිබුණි. අසම්පූර්ණ වාර්තා පදනම් කරගනිමින් ප්‍රත්‍යාගණන වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. | තක්සේරු වාර්තා නිසිපරිදි සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කල යුතුය. | ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට අදාල කටයුතු සිදුකරමින් පවතින අතර ඉදිරියේදී තක්සේරු වාර්තා පරිදි කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභාව සතු ළිං 37 කින් 10 ක් මැනුම් කර නොතිබුණු අතර, ළිං 07 ක් අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පැවතුණි. එමෙන්ම ළිං 17 ක් භාවිතයට නොගෙන අතහැර දමා තිබූ අතර, ළිං 02 ක් භෞතිකව සොයාගත නොහැකි වී තිබුණි. | වත්කම් නඩත්තු කිරීමට හා ආරක්ෂා කිරීමට කටයුතු කල යුතුය. | සභාව සතු සියලු දේපල වලට අදාල මිණුම් කටයුතු අලුත්වැඩියා කිරිම වැනි ඉදිරියේදී ඉටුකල යුතු කාර්යයන් සම්බන්ධව කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |
| (ඇ) | වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 5,507,591 ක ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ නිරවුල් කිරිමට කටයුතු කරන බව දන්වමි. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| | නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලේකම්, ගණකාධිකාරි, මහජන සෞඛ්‍ය පරීක්ෂක, විදුලි කාර්මික සහ ආයුර්වේද ඖෂධ සංයෝජක යන තනතුරු පුරප්පාඩුව පැවතීම කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතුවේ. | කාර්ය මණ්ඩල ඌනතා සම්බන්ධව විස්තර මාසිකව ඉහල කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරනු ලැබුවද පළාත් සභාවෙන් ඒ සඳහා විසඳුම් ලැබී නොමැත. |
| (ආ) | වසර 15 කට වැඩි කාලයක සිට පැවත එන මියගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය සහ සේවය අත්හිට වූ නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු.85,618 ක් අයකර ගැනීමට හෝ ආයතන සංග්‍රහයේ 4.3,4.4,4.5 සහ 4.6 හි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ 4.3,4.4,4.5 සහ 4.6 හි විධිවිධාන පරිදි කටයුතු කළ යුතුවේ. | හිග ණය මුදල් ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නිෂ්ක්‍රීය වත්කම්

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.1,320,000 ක් වූ වාහන 02 ක් වර්ෂයකට වැඩි කාලපරිච්ඡේදයක් නිෂ්කාර්යව පැවතුණි . | අලුත්වැඩියා කර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම වාහන අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කිරීමට ඇති බව දන්වමි. |

### 3.4.2 වාහන උපයෝජනය

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 05 ක පමණ කාලයක් භාවිතයෙන් ඉවත්කර තිබූ රු.978,803 ක් වූ වාහන 05 ක් වෙන්දේසි කිරිමට 2018 ජුලි 06 දින පැවති මහ සභාවේ දි තීරණය කර තිබූ අතර එම වාහන තක්සේරු කර මිල ගණන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීඑල්ජී/10/7/1 හා 2019 අගෝස්තු 15 දිනැති ලිපිය මඟින් තක්සේරු මණ්ඩලය පත්කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | තක්සේරු වටිනාකම් ලබාගෙන අපහරණ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. | භාවිතයෙන් ඉවත් කරන ලද වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා ඒවායේ වටිනාකම් තක්සේරු කරදෙන ලෙස දන්වමින් කෑගල්ල මෝටර් රථ පරීක්ෂක වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. |

### 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ) ප්‍රකාරව නගර සභාව විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, එහි 4.2 (ඇ) ප්‍රකාරව එළඹෙන වසර සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මද පිළියෙල කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ දි රු.29,405,377 ක කර්මාන්ත, සැපයීම් හා සේවා ප්‍රසම්පාදන සැලැස්මකින් තොරව ඉටුකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2021 වර්ෂය සඳහා කර්මාන්ත හා සැපයුම් සේවාද ඇතුලත් කරමින් විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 ජනවාරි 12 දිනැති අංක DMA/ 01-2019 දරන විගණන කළමනාකරණ චක්‍රලේඛ ප්‍රකාරව වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු 01 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට අපේක්ෂිත බව දන්වමි. |

### 4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| | **නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- | --- |
| (අ) | 2012 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු. 3,657ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | අවිනිශ්චිත ගිණුම ඉක්මනින් නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | පැරණි සති පොල කඩ 52 කින් අයවියයුතු රු.1,532,780 ක් කඩ හිමියන් සමඟ ගිවිසුම්ගත නොවීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකිවීමෙන් කපා හැරීමට කටයුතු කරමින් පවතින බව නිරීක්ෂණය විය. | නීත්‍යානුකූල ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අයකර ගත නොහැකි මුදල කපා හැරීමේ නියෝග ලබාගැනීමට 2015 ජූනි 15 දින සභා තීරණය අනුව අදාල අනුමැතිය ඉල්ලා තිබුණද, මෙතෙක් ඊට අදාල තීරණ ලැබී නොමැත. |
| (ඇ) | නගර සභා ආඥාපනතේ 255වන අධිකාරියේ 160 වගන්තිය ප්‍රකාරව නගර සභාවක් විසින් නගරය ඇතුලත පිහිටි යම් නිශ්චල දේපළක හෝ යම් නිශ්චිත දේපළ වර්ගයක වාර්ෂික තක්සේරුව අනුව වරිපනම් බද්දක් පනවා අයකරනු ලැබියයුතු වුවත් 2009 වර්ෂයෙන් පසු වාර්ෂික තක්සේරුවක් කර නොතිබුණි. | නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරියේ 160 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් දේපල තක්සේරු කිරීම 2014 වර්ෂයේ සිට මේ දක්වා අවස්ථා ගණනාවකදී දැනුම් දී තිබුණද, මෙතෙක් තක්සේරු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වී නොමැති බැවින් එය නගර සභාවේ දුර්වලතාවයක් නොවන බව දන්වමි. |